ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අති විශෙෂ

අංක 2092/67 - 2018 ඔක්තෝබර් මස 12 වැනි සිකුරාදා - 2018.10.12

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

## උතුරු මැද පළාතේ පළාත් සභාව

### උතුරු මැද පළාත් සභාවේ 2017 අංක 03 දරන උකස් ගන්නන්ගේ ප්‍රඥප්තිය 55 වගන්තිය යටතේ නියෝගය

උතුරු මැද පළාත් සභාවේ 2017 අංක 03 දරන උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියේ 55 වගන්තියෙන් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාරව උතුරු මැද පළාතේ, ආණ්ඩුකාරවර මාරප්පුලිගේ ජයසිංහ වන මම උකස් ගන්නන්ගේ ප්‍රඥප්තියට අදාළ පහත සඳහන් නියෝග 2018 ජනවාරි මස 01 වැනි දින සිට ක්‍රියාත්මක කිරීමට මෙයින් නියම කරමි.

නියෝග

1. ලියාපදිංචි ගාස්තු, වාර්ෂික බලපත්‍ර ගාස්තු සහ ඇප තැන්පතු

| | | | |
|---|---|---|---|
| i. | උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් කරගෙන යාම සඳහා ලියාපදිංචි ගාස්තුව - 4(1) වගන්තිය | - | රු.25,000.00 |
| ii. | උකස් ගන්නන්ගේ ව්‍යාපාරයක් සඳහා වාර්ෂික බලපත්‍ර ගාස්තුව - 9(1) වගන්තිය | - | රු.5,000.00 |
| iii. | බලපත්‍රලාභියෙකු විසින් තැන්පත් කළ යුතු ඇප මුදල - 7(1) වගන්තිය | - | රු.100,000.00 |

2. පොළී අනුප්‍රමාණය

ණයට දෙනු ලබන සෑම රුපියලකින් හෝ රුපියලකින් කොටසක් සඳහා පොළී අනුප්‍රමාණය සෑම මාසයක් හෝ මාසයකින් කොටසක් සඳහා ශත දෙකක් විය යුතු ය.- II වන උපලේඛනය

3. යම් භාණ්ඩයක් උකස් තැබීම සඳහා උකස් ගන්නෙකු වෙත ඉදිරිපත් කිරීමේ දී උකස් කරන්නා විසින් ඉදිරිපත් කළ යුතු ජාතික හැඳුනුම්පත, වලංගු විදේශ ගමන් බලපත්‍රය හෝ රියදුරු බලපත්‍රයෙහි ඡායා පිටපතක් සෑම උකස් ගන්නෙකු විසින් ම තම භාරයේ රඳවා තබා ගත යුතු ය.

මාරප්පුලිගේ ජයසිංහ,
ආණ්ඩුකාරවර,
උතුරු මැද පළාත.

අනුරාධපුර,
ආණ්ඩුකාර කාර්යාලයේ දී ය.

1A - PG 4281 - 107 (2018/10) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.